සබරගමුව පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභා
චක්‍රලේඛ ලිපි අංක 11/ 2020

මගේ අංකය: PPSC/ES/14/FI/06/3-2
පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභා කාර්යාලය
සබරගමුව පළාත් සභා සංකීර්ණය
නව නගරය - රත්නපුර
2020.07.08

ලේකම්,
සෞඛ්‍ය සුභසාධන, පරිවාස හා ළමාරක්ෂක, ග්‍රාම සංවර්ධන
සහ ග්‍රාමීය කර්මාන්ත අමාත්‍යාංශය,
සබරගමුව පළාත් සභාව.

**<u>සබරගමුව පළාත් සභා රාජ්‍ය සේවයෙහි III වන ශ්‍රේණියේ ග්‍රාම සංවර්ධන නිලධාරීන්ගේ පළමු කාර්යක්ෂමතා කඩඉම් විභාගය - 2020 සැප්තැම්බර්</u>**

සබරගමුව පළාත් සභා රාජ්‍ය සේවයේ III වන ශ්‍රේණියේ ග්‍රාම සංවර්ධන නිලධාරීන් ලෙස සේවය කරන සබරගමුව පළාත් රාජ්‍ය සේවයේ නිලධාරීන්ගෙන් උක්ත විභාගය සඳහා අයදුම්පත් කැඳවනු ලැබේ. විභාගය සිංහල භාෂා මාධ්‍යයෙන් පවත්වනු ලැබේ. මෙම චක්‍රලේඛ ලිපිය සබරගමුව පළාත් රාජ්‍ය සේවයේ III වන ශ්‍රේණියේ ග්‍රාම සංවර්ධන නිලධාරීන්ගේ දැනගැනීම සඳහා වහාම යොමු කරන්න. ප්‍රාදේශීය ලේකම් කාර්යාලවල සිටින නිලධාරීන්ගේ දැනගැනීම සඳහා ද මෙය යැවිය යුතු වේ.

02. අදාළ බඳවා ගැනීමේ පරිපාටියට අනුව මෙම විභාගයේ විෂය නිර්දේශය පහත සඳහන් පරිදි වේ.

| ප්‍රශ්න පත්‍රයේ නම | විෂය නිර්දේශය | කාලය | මුළු ලකුණු |
|---|---|---|---|
| I. ආයතන සංග්‍රහය හා මුදල් රෙගුලාසි | ආයතන සංග්‍රහයේ පරිච්ඡේද II, VI, VII, VIII ,XII, XIII, XIV, XVII, XXIV, XXV, XXVI, XXVII, XXVIII, XXX, XXXIII, XLVII, XLVIII<br>මුදල් රෙගුලාසි හි පරිච්ඡේද I – V හා ප්‍රසම්පාදන ක්‍රියාවලිය | පැය 03 | 100 |
| II. විෂයානුබද්ධ දැනුම | ග්‍රාම සංවර්ධන ප්‍රඥප්තිය පිළිබඳ දැනුම. පළාතේ සාමාජීය හා ආර්ථික තොරතුරු, සමාජ ව්‍යුහය, සංවිධානය හා කාර්යයන්, ව්‍යාපෘති වාර්තා සකස් කිරීම, ඇගයීම, පාලනය හා පසුවිපරම | පැය 01 | 100 |

සටහන:- සාමාර්ථය සඳහා එක් විෂයකට 40%කට නොඅඩු ලකුණු සංඛ්‍යාවක් ලබා ගත යුතුය. ප්‍රශ්න පත්‍ර දෙකම සමත් වූ පසු සමස්ත විභාගය සමත් වූවා සේ සැලකේ.

03. මේ අනුව මෙම විභාගයට පෙනී සිටීමට අවශ්‍ය නිලධාරීන් මීට අමුණා ඇති ආදර්ශ අයදුම්පත් ආකෘතිය ප්‍රකාර අයදුම්පත් තම පෞද්ගලික ලිපි ගොනුව නඩත්තු කරන කාර්යාලයේ / දෙපාර්තමේන්තුවේ ප්‍රධානියා මගින් **2020.07.31** දිනට ප්‍රථම ලැබෙන සේ මා වෙත එවිය යුතුය.

04. මීට පෙර මෙම කාර්යක්ෂමතා කඩඉම් විභාගයට පෙනී සිට එම අවස්ථාවල දී විභාගය අසමත් වී නැවත අයදුම් කරන්නේ නම් රු 500/- ක විභාග ගාස්තුවක් ගෙවිය යුතු අතර එක් විෂයක් සඳහා පමණක් අයදුම් කරන්නේ නම් රු 250/- ක විභාග ගාස්තුවක් ගෙවිය යුතු ය. එම විභාග ගාස්තුව මෙම පළාත් සභාවේ අමාත්‍යාංශ කාර්යාලයකට/දෙපාර්තමේන්තුවකට (පළාත් පාලන ආයතන හැර) ගෙවිය යුතු ය.එසේ ගෙවන විභාග ගාස්තුව සබරගමුව පළාත් සභාවේ **20.03.02.99** ආදායම් ශීර්ෂයට බැර වන සේ ගෙවා ලබා ගන්නා ලදුපත, අයදුම්පත්‍රයේ පසුපිටෙහි නොගැලවෙන සේ ඇලවිය යුතු ය.

05. මෙම විභාගය 2020 සැප්තැම්බර් මාසයේදී පැවැත්වීමට නියමිත අතර පවත්වන දිනය, ස්ථානය අපේක්ෂකයන්ට විභාග ප්‍රවේශ පත්‍ර මගින් යථා කාලයේ දී දැනුම් දෙනු ලැබේ.

පී.එස්.ආර්.එම්.විජයරාජ
ලේකම්
පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව
සබරගමුව පළාත

<u>පිටපත්</u>
1. ප්‍රධාන ලේකම්, සබරගමුව පළාත් සභාව - කාරුණික දැනගැනීම සඳහා

අයදුම්පත් ආකෘතිපත්‍රය

(කාර්යාලීය ප්‍රයෝජනය සඳහා)

## සබරගමුව පළාත් රාජ්‍ය සේවයේ III ශ්‍රේණියේ ග්‍රාම සංවර්ධන නිලධාරීන් සඳහා වන පළමු වන කාර්යක්ෂමතා කඩඉම් විභාගය - 2020 සැප්තැම්බර්

01. (අ) මුලකුරු සමඟ නම:-..........................................................................................................
(ඉංග්‍රීසි කැපිටල් අකුරින්) (මුලකුරු අගට යොදන්න. උදා:- SILVA A.B.)

(ආ) සම්පූර්ණ නම :-..........................................................................................................

(ඇ) මුලකුරු සමඟ නම:-..........................................................................................................

(ඈ) රාජකාරී ලිපිනය:-..........................................................................................................
(මෙම ලිපිනයට ප්‍රවේශ පත්‍ර තැපැල් කරනු ලැබේ.)

(ඉ) ස්ත්‍රී / පුරුෂ භාවය:-..........................................................................

02. ජාතික හැඳුනුම්පත් අංකය:- | | | | | | | | | | |

03. උපන් දිනය:- වර්ෂය [ ] මාසය [ ] දිනය [ ]

04. ඔබ ග්‍රාම සංවර්ධන නිලධාරී III ශ්‍රේණියට පත් වූ දිනය:-..........................................................

05. ඉහත සඳහන් විස්තර නිවැරදි බවත්, මෙම විභාගයට පෙනී සිටීමට හිමිකම් ඇති බවත් ප්‍රකාශ කරමි. තවද විභාගය පැවැත්වීම සම්බන්ධයෙන් සබරගමුව පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභා ලේකම් විසින් පනවනු ලබන නීති රීතිවලට යටත්වන බව ද ප්‍රකාශ කරමි.

දිනය:-

..........................................................
අපේක්ෂකයාගේ/ අපේක්ෂිකාවගේ අත්සන

---

ඉහත නම් සඳහන් අපේක්ෂකයාට විභාගයට පෙනී සිටීම සඳහා සුදුසුකම් ඇති බව සහතික කරමි.

දිනය :-

..........................................................
දෙපාර්තමේන්තු / ආයතන ප්‍රධානියාගේ
අත්සන හා පදවි නාමය
(කරුණාකර නිලමුද්‍රාව තබන්න.)